# ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට හා ස්ථානභාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021|10|25 දින
අනුමත කරන ලදී.

ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

**<u>ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට හා ස්ථානභාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>**

ඌව පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ආයතනයන්හි ගිනි නිවීමේ සේවයේ පළමුවන පන්තියේ ගිනිභට තනතුරට අදාළව 2008.09.02 දින ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය යටතේ ගන්නා ලද කිසියම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි එම බඳවා ගැනීමේ පරිපාටිය පරිච්ඡින්න කොට 2019.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ.

1. **සම්බන්ධ වන ආයතන**

 1.1. දෙපාර්තමේන්තුව :- පළාත් පාලන දෙපාර්තමේන්තුව - ඌව පළාත
 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය
 යොමු අංකය :- 12/01/14 දිනය :- 2021.09.27

 1.2. අමාත්‍යාංශය :- පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශය - ඌව පළාත
 අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය
 යොමු අංකය :- 9/ආ/10/10/14 දිනය :- 2021.10.01

 1.3. ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :-
 යොමු අංකය :- 4/AD/ES/10/02/01/02 ( 1 වෙළුම ) දිනය :- 2021.10.13

 1.4. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :-
 යොමු අංකය :- DMS/UV/0304 දිනය :- 2018.08.17

 1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :-
 යොමු අංකය :- NSCC/10/P/GE/SR/10 දිනය :- 2018.05.11

2. **පත් කිරීම් බලධාරියා :- ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
 ***ක්‍රියාත්මක වන දිනය :- 2019.01.01 දින සිට***

3. **සේවා ගණය පිළිබඳ විස්තර**

 3.1. සේවා ගණය :- නියාමන සේවා

 3.2. ශ්‍රේණි :- අදාළ නොවේ

 3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :-

 ඌව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ආයතනවල මහා නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා අණ පනත්වලට අනුකූලව හදිසි ගිනි ගැනීම් වලදී හා ආපදා තත්වයන්හි දී ජීවිත හා දේපළ විනාශය වළක්වා ගැනීම සඳහා පළපුරුද්ද හා අත්දැකීම් හසුරුවමින්, පූර්ව ආපදා පාලනයට කටයුතු කිරීම, නියමිත කාර්යයන් මෙහෙයවා ගනිමින් ආපදා අවස්ථාවල සිදුවන හානි අවම කර ගැනීමට කටයුතු කිරීම හා ආපදා පසු පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට අදාළව කළමනාකරණ, අධීක්ෂණ හා මෙහෙයුම් කටයුතු මෙම සේවා ගණයේ තනතුරුවලට අදාළ කාර්ය පථයන්ට අයත් වේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021/10/25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

3.4. කාර්යයන් පැවරීම :-

තනතුරට නියම කරන ලද, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන අවස්ථානුකූලව ඕනෑම පළමු පෙළ හා මූලික ගිනිහට නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා / ස්ථානභාර නිලධාරි විසින් පවරනු ලැබිය හැකිය.

ස්ථාන භාර නිලධාරී තනතුරට නියම කරන ලද කාර්යයන් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

## 4. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.
වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායකවිය යුතුය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

## 5. වැටුප්

5.1. වැටුප් කේත අංක :-

| | | |
|---|---|---|
| පළමු පෙළ ගිනිහට | - | RS 2 - 2016 |
| මූලික ගිනිහට | - | RS 3 - 2016 |
| ස්ථාන භාර නිලධාරී | - | RS 4 - 2016 |

5.2. වැටුප් පරිමාණය :-

RS 2 - 2016 වැටුප් කේතය සඳහා
රු: 32,010 - 9x370 - 17x495 - රු: 43,755/-

RS 3 - 2016 වැටුප් කේතය සඳහා
රු: 32,790 - 7x370 - 2x495 - 25x660 - රු: 52,870/-

RS 4 - 2016 වැටුප් කේතය සඳහා
රු: 37,030 - 24x660 - රු: 52,870/-

5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව RS වැටුප් ක්‍රමය ලබා දී ඇති තනතුරු සඳහා ශ්‍රේණිගත උසස් වීම් ක්‍රමයක් අදාළ නොවන බැවින් තනතුරට නියමිත ආරම්භක වැටුප් පියවර පහත පරිදි වේ. තනතුරු උසස් කිරීම සිදු කළ යුත්තේ එක් එක් තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇති වන පුරප්පාඩු සඳහා පමණක් විය යුතුය.

| තනතුරු නාමය | වැටුප් කේත අංකය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු:) |
|---|---|---|---|
| පළමු පෙළ ගිනිහට | RS 2 - 2016 | පියවර 01 | 32,010/- |
| මූලික ගිනිහට | RS 3 - 2016 | පියවර 01 | 32,790/- |
| ස්ථානභාර නිලධාරි | RS 4 - 2016 | පියවර 01 | 37,030/ |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

## 6. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනු අංකය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|---|
| 01 | පළමු පෙළ ගිනිභට | 05 | I. ගිනි නිවීම සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම්, පුහුණු කිරීම් හා අවශ්‍ය වෙනත් සියලුම රාජකාරි කටයුතු සඳහා යොදා ගනු ලබන ස්නෝකර් රථ, ස්කයිලිෆ්ට් රථ, දිගුකල හැකි ඉනිමං සහිත මහා පරිමාණ විශේෂිත ගිනි රථ පැදවීම සහ ගිනි නිවීම සඳහා යොදා ගනු ලබන සියලුම වර්ගයේ ගිනි රථ ක්‍රියා කරවීම හා නඩත්තු කිරීම සහ අදාළ සියලුම තාක්ෂණික උපකරණ ක්‍රියා කරවීම, නඩත්තු කිරීම හා ආරක්ෂාව.<br>II. ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වාගෙන යාම සහ මෙහෙයුම් ස්ථානවලදී මෙහෙයුම් කටයුතු සඳහා ගිනිභට හා මෝටර් යාන්ත්‍රික ගිනිභට නිලධාරීන් නිසි පරිදි මෙහෙයවීම.<br>III. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝගවලට අනුව තම කාර්යයන් ඉටු කිරීම.<br>IV. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම. |
| 02 | මූලික ගිනිභට | 04 | I. රාජකාරි කණ්ඩායම් මෙහෙයවීම, නායකත්වය දැරීම සහ ගිනිභට, මෝටර් යාන්ත්‍රික ගිනිභට, පළමු පෙළ ගිනිභට තනතුරුවල කාර්යයන් අධීක්ෂණය කිරීම.<br>II. ගිනි නිවීම් සේවා වලට අදාළ සියලු තාක්ෂණික උපකරණ සම්බන්ධ වගකීම දැරීම.<br>III. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝගවලට අනුව තම කාර්යයන් ඉටු කිරීම.<br>IV. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම. |
| 03 | ස්ථාන භාර නිලධාරී | 04 | I. රාජකාරි කණ්ඩායම් මෙහෙයවීම, නායකත්වය දැරීම සහ ගිනිභට, මෝටර් යාන්ත්‍රික ගිනිභට, පළමු පෙළ ගිනිභට සහ මූලික ගිනිභට තනතුරුවල කාර්යන් අධීක්ෂණය, අණදීම.<br>II. ගිනි මෙහෙයුම් හා වෙනත් ආපදා කටයුතු, ගිනි නිවාරණ කටයුතු, පුහුණු කටයුතු හා අභ්‍යන්තර විනය පවත්වා ගෙන යාම.<br>III. ප්‍රාදේශිය නිලධාරි රාජකාරි කටයුතු සඳහා සහාය දීම.<br>IV. ගිනි නිවීම් සේවා ස්ථානයේ රාජකාරි කටයුතුවලදී සහභාගි වන මානව සම්පත් හා අදාළ සියලුම කාර්යයන් අධීක්ෂණය හා කළමනාකරණය.<br>V. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම. |

* එක් එක් පළාත් පාලන ආයතන වෙනුවෙන් මෙම තනතුරු අනුමත කර ඇති ආකාරය උපලේඛන 01 මගින් දක්වා ඇත.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 10 25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :-

පළමු පෙළ ගිනිහට, මූලික ගිනිහට, ස්ථානභාර නිලධාරී තනතුරුවල ශ්‍රේණි ක්‍රමයක් නොපවතින බැවින් ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් ලෙස සැලකිය හැකි නිලධර සංඛ්‍යාවක් නොපවතී. පළමු පෙළ ගිනිහට, මූලික ගිනිහට, ස්ථානභාර නිලධාරී තනතුරු වලට අදාළ නිලධාරී සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරනු ලබන පරිදි තීරණය වේ.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1. පළමු පෙළ ගිනිහට තනතුරට බඳවා ගැනීම

7.1.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.1.2. විවෘත බඳවා ගැනීම :- අදාළ නොවේ.

7.1.3. සීමිත බඳවා ගැනීම

7.1.3.1. සුදුසුකම්

7.1.3.1.1. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

7.1.3.1.2. වෘත්තීය සුදුසුකම් :-

I. මෝටර් යාන්ත්‍රික ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර තිබීම.
II. මෝටර් යාන්ත්‍රික ගිනිහට තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
III. මෝටර් යාන්ත්‍රික ගිනිහට තනතුරේ අවම වශයෙන් වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.1.3.1.3. පළපුරුද්ද :- අදාළ නොවේ.

7.1.3.1.4. කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.1.3.1.5. වෙනත් සුදුසුකම් :- තනතුරට බඳවා ගැනීම සඳහා නියමකර ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.1.4. වයස

7.1.4.1. අවම සීමාව :- අදාළ නොවේ.

7.1.4.2. උපරිම සීමාව :- අදාළ නොවේ.

2021|10|25
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

7.1.5. බඳවා ගැනීමේ ක්‍රමය

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින් සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා අවශ්‍ය අවම මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කරන අතර යථෝක්ත පරීක්ෂණයන්හි මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත පදනම්ව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. තනතුරට අදාළ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ.

7.1.5.1. ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයුම් | 100 | 40 |
| විශේෂිත ගිනි රථ භාවිතය | 100 | 40 |

( විෂය නිර්දේශය උපලේඛන 02 හි දැක්වේ. )

7.1.5.1.1. ලිඛිත පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.1.5.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ.

7.1.5.3. වෘත්තීය පරීක්ෂණය :-

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනිරථ සහ පොම්ප භාවිතය | 100 | 60 |
| ගිනිරථ පැදවීම | 100 | 60 |

( විෂය නිර්දේශය උපලේඛන 03 හි දැක්වේ. )

7.1.5.3.1. වෘත්තීය පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.1.5.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

7.1.5.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ ලේකම්

7.2. මූලික ගිනිහට තනතුරට බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2.2. විවෘත බඳවා ගැනීම :- අදාළ නොවේ.

7.2.3. සීමිත බඳවා ගැනීම

7.2.3.1. සුදුසුකම්

7.2.3.1.1. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

7.2.3.1.2. වෘත්තීය සුදුසුකම් :-

I. පළමු පෙළ ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා එම තනතුරේ අවම වශයෙන් වසර 03 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

හෝ

II. ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය සමත් මෝටර් යාන්ත්‍රික ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා එම තනතුරේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

7.2.3.1.3. පළපුරුද්ද :- අදාළ නොවේ.

7.2.3.1.4. කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.2.3.1.5. වෙනත් සුදුසුකම් :- තනතුරට බඳවා ගැනීම සඳහා නියමකර ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.4. වයස

7.2.4.1. අවම සීමාව :- අදාළ නොවේ.

7.2.4.2. උපරිම සීමාව :- අදාළ නොවේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021/10/25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

7.2.5. බඳවා ගැනීමේ ක්‍රමය

ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින් සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා අවශ්‍ය අවම මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර යථෝක්ත පරීක්ෂණයන්හි මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත පදනම්ව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.2.5.1. ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | 100 | 40 |
| ගිනි ඉංජිනේරු තාක්ෂණය හා මෙවලම් | 100 | 40 |
| විධානය හා නායකත්වය | 100 | 40 |

( විෂය නිර්දේශය උපලේඛන 04 හි දැක්වේ )

7.2.5.1.1. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම් | 10 | |
| අමතර සේවා කාලය | 30 | |
| රාජකාරියේදී දක්වන ලද විශේෂ කුසලතා | 30 | අදාළ නොවේ. |
| කාර්යසාධන ඇගයීම් | 25 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

( ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පටිපාටිය උපලේඛන 05 මගින් දැක්වේ. )

7.2.5.2.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5.3. වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ.

7.2.5.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.10.25 දින අනුමත කරන ලදී.

7.3. ස්ථාන භාර නිලධාරී තනතුරට බඳවා ගැනීම

7.3.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.3.2. විවෘත බඳවා ගැනීම :- අදාළ නොවේ.

7.3.3. සීමිත බඳවා ගැනීම

7.3.3.1. සුදුසුකම්

7.3.3.1.1. අධ්‍යාපන සුදුසුකම් :- අදාළ නොවේ.

7.3.3.1.2. වෘත්තීය සුදුසුකම් :-

I. මූලික ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා එම තනතුරේ අවම වශයෙන් වසර තුන (03) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

හෝ

II. ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය සමත් පළමු පෙළ ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා එම තනතුරේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

හෝ

III. ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය සමත් මෝටර් යාන්ත්‍රික ගිනිහට තනතුරේ සේවය ස්ථිර කර ඇති අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් හා එම තනතුරේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම.

7.3.3.1.3. පළපුරුද්ද :- අදාළ නොවේ.

7.3.3.1.4. කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

7.3.3.1.5. වෙනත් සුදුසුකම් :- තනතුරට බඳවා ගැනීම සඳහා නියමකර ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.4. වයස

7.3.4.1. අවම සීමාව :- අදාළ නොවේ.

7.3.4.2. උපරිම සීමාව :- අදාළ නොවේ.

ඌව පළාත් භාර ආණ්ඩුකාරතුමා විසින් 2021/10/25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

7.3.5. බඳවා ගැනීමේ ක්‍රමය

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර නිවේදනයක් මගින් සුදුසුකම් සම්පූර්ණ කළ අභ්‍යන්තර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා අවශ්‍ය අවම මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර යථෝක්ත පරීක්ෂණයන්හි මුළු ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත පදනම්ව පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.3.5.1. ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | 100 | 40 |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 100 | 40 |
| ගිනි ප්‍රවේශම | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | 100 | 40 |

( විෂය නිර්දේශය උපලේඛන 06 හි දැක්වේ. )

7.3.5.1.1. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම් | 10 | |
| අමතර සේවා කාලය | 30 | |
| රාජකාරියේදී දක්වන ලද විශේෂ කුසලතා | 30 | අදාළ නොවේ. |
| කාර්යසාධන ඇගයීම් | 25 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

( ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදීමේ පටිපාටිය උපලේඛන 07 මගින් දැක්වේ. )

7.3.5.2.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන බලධරයා :-
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5.3. වෘත්තීය පරීක්ෂණය :- අදාළ නොවේ.

7.3.5.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.10.25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්

**8. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද? | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| පළමු පෙළ ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම | පළමු පෙළ ගිනිහට තනතුරට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයකි ( උපලේඛන 08 හා 09 ) |
| මූලික ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම | මූලික ගිනිහට තනතුරට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි ( උපලේඛන 10 ) |
| ස්ථාන භාර නිලධාරී තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම | ස්ථාන භාර නිලධාරී තනතුරට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි ( උපලේඛන 11 ) |

8.2.කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ?
වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**9. භාෂා ප්‍රවීණතාවය**

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | අදාළ නොවේ. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච. 18/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. |

**10. උසස් කිරීම** :- අදාළ නොවේ.

**11. තනතුරුවලට පත් කිරීම** :- අදාළ නොවේ.

**12. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහයටද, ඌව පළාතේ පළාත් සභා මුදල් රීති සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ චක්‍රලේඛ, රෙගුලාසි, උපදෙස්, මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත, ප්‍රාදේශීය සභා පනත හා ඒවාට අදාළව වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, යටත් වන්නේ ය.

**13. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ**

13.1. "බඳවා ගැනීමේ පරිපාටිය" යනුවෙන් අදහස් වන්නේ, ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතන වල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිහට, මූලික ගිනිහට හා ස්ථාන භාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය වේ.

ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින්
2021/10/25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

13.2. “අමාත්‍යාංශ ලේකම්” යනුවෙන් අදහස් වන්නේ, ඌව පළාතේ පළාත් පාලන විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.3. “දෙපාර්තමේන්තු ප්‍රධානියා” යනුවෙන් අදහස් වන්නේ, ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා වේ.

13.4. “ආයතන ප්‍රධානියා” යනුවෙන් අදහස් වන්නේ, ගිනි නිවීමේ ඒකක අනුමත කර ඇති ඌව පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන ප්‍රධානියා වේ.

13.5. “තනතුරු” යන පදයෙන් අදහස් වන්නේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට හා ස්ථාන භාර නිලධාරී තනතුරු වේ.

13.6. “සාමාන්‍ය කාර්ය සාධනය” යනුවෙන් අදහස් වන්නේ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/98 අනුව කාර්ය සාධන ඇගයීම් වාර්තාවේ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ යනුවෙන් වර්ගීකරණය කර තිබීම වේ.

13.7. “සතුටුදායක සේවා කාලය” යනුවෙන් අදහස් වන්නේ, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මඟින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වීම මඟින් ද, පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ අවවාද කිරීමක් හැර දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේ ය.

13.8. “සක්‍රීය සේවා කාලය” යනුවෙන් අදහස් වන්නේ, වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැළකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14. අන්තර්ග්‍රහණය**

ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණය යටතේ පළමුවන පන්තියේ ගිනිභට / පළමු පෙළ ගිනිභට තනතුරුවල සේවයේ යෙදී සිටින්නන්ට පමණක් මෙම අන්තර්ග්‍රහණ විධිවිධාන අදාළ වේ.

14.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) හි RS 1 – 2006 A වැටුප් පරිමාණය යටතේ පත්වීම් ලබා 2019.01.01 දින වන විට පළමුවන පන්තියේ ගිනිභට / පළමු පෙළ ගිනිභට තනතුරේ ස්ථිර සේවයේ නියුතු සියලු දෙනාම මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන 2019.01.01 දින සිට මෙම පරිපාටිය යටතේ පළමු පෙළ ගිනිභට තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.2. ඉහත 14.1 පරිදි පළමු පෙළ ගිනිභට තනතුරට අන්තර්ග්‍රහණය කරන නිලධාරීන්, පළමුවන පන්තියේ ගිනිභට / පළමු පෙළ ගිනිභට තනතුරෙහි මුල් පත්වීමේ දින සිට 2019.01.01 දින දක්වා උපයාගත් වැටුප් වර්ධක සංඛ්‍යාව පදනම් කරගනිමින් මෙම තනතුරට අදාළ ආරම්භක වැටුප් පියවර වන RS 2 - 2016 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ සිට අදාළ උපයාගත් වැටුප් වර්ධක සංඛ්‍යාව ලබා දී RS 2 - 2016 වැටුප් පරිමාණයේ ඊට අදාළ වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

උදා :- 2012.09.17 දිනැතිව පළමු පෙළ ගිනිභට තනතුරට පත්වීම් ලද නිලධාරීන් 2019.01.01 දිනට උපයාගත් වැටුප් වර්ධක සංඛ්‍යාව 06 කි. ඒ අනුව අදාළ නිලධාරියා 2019.01.01 දිනට RS 2 - 2016 වැටුප් පරිමාණයේ 7 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.10.25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

14.3. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඉහත තනතුරුවලට ස්ථිර වශයෙන් පත් කරන ලද දිනය පදනම් කරගෙන වන අතර අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතුය. එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව පවතී.
( අන්තර්ග්‍රහණයට අදාළ මනාප ප්‍රකාශ කිරීමේ අයදුම්පත උපලේඛන 12 මඟින් දක්වා ඇත.)

14.4. මෙම සියලුම අන්තර්ග්‍රහණය කිරීම් සඳහා ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මඟින් ඉල්ලීම් කළ පසු ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අන්තර්ග්‍රහණය කිරීමේ ලිපි නිකුත් කරනු ලැබේ. මේ සඳහා මූලික කටයුතු සම්පාදනය කිරීම ආයතන ප්‍රධානියා විසින් සිදුකළ යුතුය.

**15.** අන්තර්කාලීන විධිවිධාන

15.1. මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වීමට පෙර 2008.09.02 දින සිට ක්‍රියාත්මකව පැවති ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ගිනි නිවීමේ සේවයේ පළමුවන පන්තියේ ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරන ලද නිලධාරීන්, මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි පළමු පෙළ ගිනිහට තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූවා සේ සළකනු ලැබේ.

15.2. මෙම පරිපාටිය යටතේ පළමු පෙළ ගිනිහට තනතුර සඳහා අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට පෞද්ගලික වන සේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා මෙම පරිපාටියට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපිය නිකුත් කරන දින සිට වසර තුන (03) ක සහන කාලයක් ලබා දෙනු ලැබේ.

15.3. මෙම පරිපාටිය යටතේ 2019.01.01 දිනට පළමු පෙළ ගිනිහට තනතුර සඳහා අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්, රා.ප.ච. 01/2014 හා එහි අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුය. මේ දක්වා අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් රා.ප.ච. 18/2020 හි විධිවිධාන අදාළ වේ.

15.4. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NSCC/12/78/2/1/SR දරන 2020.06.12 දිනැති ලිපියෙහි උපදෙස්වලට අනුකූලව, ඉහත 14.1 හා 14.2 විධිවිධාන පරිදි මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පළමු පෙළ ගිනිහට තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් RS 2 - 2016 වැටුප් පරිමාණයේ නියමිත වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබා නොදී වැටුප් වර්ධකවලින් හිලව් කිරීමට කටයුතු කරනු ලැබේ. ( උපලේඛන 13 )

**16.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ඌව පළාත් සභා මූල්‍ය රීති සහ රජය / ඌව පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා / හෝ රෙගුලාසි අදාළ වේ.

**17.** මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021/10/25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

**18.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට හා ස්ථාන භාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය, සම්මත රීතියට අනුකූලව මූලික පරිපාටි සමඟ පරීක්ෂා කර, ඒ අනුසාරයෙන් අත්‍යවශ්‍ය සංශෝධන සහිතව සකස් කර ඇති බවත්, ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට සහ ස්ථාන භාර නිලධාරී තනතුරුවලට බලපාන කොන්දේසි සියල්ල අවධානයට ලක් කර ඇති බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ඇතුළු අදාළ චක්‍රලේඛවල උපදෙස් පිළිපැද ඇති බවත් සහතික කරමි. ඒ අනුව මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

9/28 .....................................      .....................................................

දිනය      ( පළාත් පාලන කොමසාරිස් - ඌව )

( නිල මුද්‍රාව )

එම්.එම්. විජේනායක
පළාත් පාලන කොමසාරිස් - ඌව
පළාත් පාලන දෙපාර්තමේන්තුව
බදුල්ල

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

නිර්දේශ කරමි / ~~නොකරමි~~.

අංකය :- 9/ආ/10/10/14

දිනය :- 2021.10.01

අත්සන :-

( නිල මුද්‍රාව )

පී.ඒ.එම්.එස්.පී. අඹන්වල
ලේකම්
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා
බලශක්ති, ඉදිකිරීම්,
ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය
ඌව පළාත් සභාව - බදුල්ල

ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

නිර්දේශ කරමි / ~~නොකරමි~~.

අංකය :- 4/AD/ES/10/02/01/02 (1 වෙළුම)

දිනය :- 2021.10.13

අත්සන :-

( නිල මුද්‍රාව )

පී.බී. විජයරත්න
ඌව පළාතේ ප්‍රධාන ලේකම්
ඌව පළාත් සභාව,
බදුල්ල

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.10.25 දින අනුමත කරන ලදී.

ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමු.

1. නීතිඥ විජිත මල්ලැහැව මහතා (සභාපති) ........................ 2021/10/14
2. නීතිඥ හේමතිලක අමරකෝන් මහතා (සාමාජික) ........................
3. කේ.එම්.ප්‍රේමසිරි මහතා (සාමාජික) ........................
4. නීතිඥ පද්මිණී මංගලිකා කොන්ඩප්පෙරුම මෙනවිය (සාමාජික) ........................
5. නීතිඥ එම්.එම්.විජිත පීරිස් මහතා (සාමාජික) ........................
6. නීතිඥ ධනුෂ්ක වැලිගම මහතා (සාමාජික) ........................
7. ආරුමුගම් මුතුලිංගම් මහතා (සාමාජික) ........................
8. එච්.එම්.වීරකෝන් බණ්ඩා මහතා (සාමාජික) ........................
9. ජී.චන්ද්‍රසේන මහතා (සාමාජික) ........................

ආණ්ඩුකාරවර ලේකම්,

2021.10.14 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 23 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට සහ ස්ථාන භාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2021/10/18 ........................

ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගාමිණී මහින්දපාල ජෝපියස්
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

අනුමත කරමි / ~~නොකරමි~~.

........................
( ඒ.ජේ.එම්.මුසම්මිල් )
ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර

දිනය 2021/10/25

ඒ.ජේ.එම්. මුසම්මිල්
ඌව පළාත් ආණ්ඩුකාරවර
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
රජ වීදිය, බදුල්ල

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021/10/25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ~~ලේකම්~~/ සහකාර ලේකම්

උපලේඛන 01

<u>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එක් එක් පළාත් පාලන ආයතන වෙනුවෙන් පළමු පෙළ ගිනිහට, මූලික ගිනිහට හා ස්ථාන භාර නිලධාරී යන තනතුරු අනුමත කර ඇති ආකාරය</u>

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බදුල්ල මහා නගර සභාව | පළමු පෙළ ගිනිහට | 2 |
| | | මූලික ගිනිහට | 1 |
| | | ස්ථානභාර නිලධාරී | 1 |
| 2 | බණ්ඩාරවෙල මහා නගර සභාව | පළමු පෙළ ගිනිහට | 1 |
| | | මූලික ගිනිහට | 1 |
| | | ස්ථානභාර නිලධාරී | 1 |
| 3 | මොණරාගල ප්‍රාදේශීය සභාව | පළමු පෙළ ගිනිහට | 1 |
| | | මූලික ගිනිහට | 1 |
| | | ස්ථානභාර නිලධාරී | 1 |
| 4 | කතරගම ප්‍රාදේශීය සභාව | පළමු පෙළ ගිනිහට | 1 |
| | | මූලික ගිනිහට | 1 |
| | | ස්ථානභාර නිලධාරී | 1 |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
202. | 10 | 25 දින
අනුමත කරන ලදී.

ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ ... ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |
| විශේෂිත ගිනි රථ භාවිතය | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා
   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
   පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා මෙහෙයුම් | 1. ගිනි නිවීම් සේවා පොම්ප හා උපකරණ<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම්වලදී පළමු පෙළ ගිනිභට රාජකාරි සඳහා යොදා ගැනීමේ අවස්ථා |
| විශේෂිත ගිනි රථ භාවිතය | 1. විශේෂිත ගිනි රථ භාවිතය පිළිබඳ දැනුම<br>2. මාර්ග නීති පිළිබඳ දැනුම |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021|10|25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීමේ වෘත්තීය පරීක්ෂණය ( ප්‍රායෝගික )**

1. පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි රථ සහ පොම්ප භාවිතය | අදාළ වන පරිදි | 100 | 60 |
| ගිනි රථ පැදවීම | අදාළ වන පරිදි | 100 | 60 |

2. පවත්වනු ලබන බලධාරියා
   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
   පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

4. පරීක්ෂණය සඳහා වන විෂයය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි රථ සහ පොම්ප භාවිතය | විවිධ ගිනි රථ ක්‍රියාකරවීම පිළිබඳ ප්‍රායෝගික හැකියාව හා ගිනි නිවීම් සේවා පොම්ප ක්‍රියාකරවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම පුළුල් වශයෙන් පරීක්ෂා කරනු ලැබේ. |
| ගිනි රථ පැදවීම | විවිධ ගිනි රථ පැදවීමේ ප්‍රායෝගික හැකියාව සහ මාර්ග නීති පිළිපැදීම. |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ මූලික ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | පැය 01 | 100 | 40 |
| ගිනි ඉංජිනේරු තාක්ෂණය හා මෙවලම් | පැය 01 | 100 | 40 |
| විධානය හා නායකත්වය | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා
   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
   පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | 1. තාප සංක්‍රමණය<br>2. තාපය හා උෂ්ණත්වය අතර සම්බන්ධතාවය හඳුනා ගැනීම<br>3. ෆැරන්හයිට් මිම්ම හා සෙල්සියස් මිම්ම අතර සම්බන්ධතාවය දැනගැනීම<br>4. ජ්වලන උෂ්ණත්වය හා දාහන අංකය |
| ගිනි ඉංජිනේරු තාක්ෂණය හා මෙවලම් | a. ප්‍රායෝගික ගිනිභටභාවය<br>i. ගින්න වෙත ලඟාවීම<br>ii. ගින්න සොයාගැනීම<br>b. ජල නල<br>i. සිදුවන හානි හඳුනා ගැනීම<br>ii. වළක්වා ගැනීම<br>iii. ගබඩා කිරීම<br>c. කෘතිම ස්වසන උපකරණ<br>i. නඩත්තුව<br>ii. විවිධ පරීක්ෂණ පිළිබඳ දැනුම |
| විධානය හා නායකත්වය | 1. කණ්ඩායම් මූලිකයෙකු වශයෙන් ඇති රාජකාරි පිළිබඳ දැනුම.<br>2. කණ්ඩායම් අතර විනය පවත්වාගෙන යාම<br>3. රාජකාරී ලැයිස්තු පිළියෙල කිරීම |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 | 10 | 25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / සහකාර ලේකම්

## ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ මූලික ගිනිභට තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|
| ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම්<br><br>ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය / ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය ( Level 2 )<br>( බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන සුදුසුකම ඉක්මවා ගිය සුදුසුකමක් ලබා තිබීම. ) | 10 | |
| අමතර සේවා කාලය<br><br>7.2.3.1.2 හි බඳවා ගැනීමේදී සලකා බලන සේවා කාලයට අමතර සේවා කාලය<br><br>පළමු පෙළ ගිනිභට - ලකුණු 06<br>මෝටර් යාන්ත්‍රික ගිනිභට - ලකුණු 05<br>( උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. ) | 30 | අදාළ නොවේ. |
| රාජකාරියේදී දක්වන විශේෂ සේවා ඇගයීම<br><br>ප්‍රශංසා ලිපි / කුසලතා සහතික / විශේෂ සේවා සඳහා ඇගයීම්<br>( පිළිගත හැකි ආයතනයක් මගින් නිකුත් කරන ලද සහතික හෝ ලිපි මගින් ඉදිරිපත් කළ යුතුය. එක් සහතිකයකට ලකුණු 05 බැගින් ) | 30 | |
| කාර්යසාධන ඇගයීම<br><br>( පූර්වාසන්න වසර 05 ක කාලය සඳහා )<br>ඉතා හොඳයි - ලකුණු 05<br>හොඳයි - ලකුණු 03<br>සතුටුදායකයි - ලකුණු 02 | 25 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදි.

ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් / ලේකම්

## ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ ස්ථානභාර නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | පැය 01 | 100 | 40 |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 01 | 100 | 40 |
| ගිනි ප්‍රවේශම | පැය 01 | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව | ගිනි මෙහෙයුම් සඳහා අදාළ විද්‍යාත්මක හා තාක්ෂණික ගණනය කිරීම් |
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් | ගිනි මෙහෙයුම් පාලනය සහ කළමනාකරණය |
| ගිනි ප්‍රවේශම | ගොඩනැගිලි සැලසුම් සහ ස්ථාවර ගිනි නිවන ක්‍රම හා ගිනි නිවාරණය |
| මානව සම්පත් කළමනාකරණය | පුහුණු සහ සංවර්ධනය, අභිප්‍රේරණය, සෞඛ්‍ය ආරක්ෂණය, ගැටුම් හා අර්බුද කළමනාකරණය, මානව සම්පත් ප්‍රතිපත්ති සැලසුම්කරණය, ව්‍යාපෘති කළමනාකරණය, කාර්ය සාධන කළමනාකරණය සම්බන්ධයෙන් පුළුල් වශයෙන් සලකා බලනු ලැබේ. |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021/10/25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ ස්ථානභාර නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|
| <u>ගිනි තාක්ෂණ අධ්‍යාපන සුදුසුකම්</u><br>ගිනි ඉංජිනේරු ප්‍රාථමික විභාගය ( Level 2 )<br>( බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන සුදුසුකම ඉක්මවා ගිය සුදුසුකමක් ලබා තිබීම. ) | 10 | අදාළ නොවේ. |
| <u>අමතර සේවා කාලය</u><br>7.3.3.1.2 හි බඳවා ගැනීමේදී සලකා බලන සේවා කාලයට අමතර සේවා කාලය<br>මූලික ගිනිභට - ලකුණු 06<br>පළමු පෙළ ගිනිභට - ලකුණු 05<br>මෝටර් යාන්ත්‍රික ගිනිභට - ලකුණු 04<br>( උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. ) | 30 | |
| <u>රාජකාරියේදී දක්වන විශේෂ සේවා ඇගයීම</u><br>ප්‍රශංසා ලිපි / කුසලතා සහතික / විශේෂ සේවා සඳහා ඇගයීම්<br>( පිළිගත හැකි ආයතනයක් මගින් නිකුත් කරන ලද සහතික හෝ ලිපි මගින් ඉදිරිපත් කළ යුතුය. එක් සහතිකයකට ලකුණු 05 බැගින් ) | 30 | |
| <u>කාර්යසාධන ඇගයීම</u><br>( පූර්වාසන්න වසර 05 ක කාලය සඳහා )<br>ඉතා හොඳයි - ලකුණු 05<br>හොඳයි - ලකුණු 03<br>සතුටුදායකයි - ලකුණු 02 | 25 | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021/10/25 දින අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ( ලිඛිත )**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |
| විශේෂ ගිනිරථ භාවිතය හා පැදවීම | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
වසරකට දෙවරක් හෝ අවශ්‍යතාවය පරිදි

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 1. පළමු පෙළ ගිනිහට රාජකාරි සඳහා අදාළ සෛද්ධාන්තික කරුණු<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම් වලදී පළමු පෙළ ගිනිහට රාජකාරි සඳහා යොදාගැනීමේ අවස්ථා පිළිබඳ දැනුම<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල දී පළමු පෙළ ගිනිහට රාජකාරි පිළිබඳ දැනුම<br>4. ගිනි නිවීම් සේවා උපකරණ පිළිබඳ දැනුම |
| විශේෂිත ගිනිරථ භාවිතය හා පැදවීම | 1. විශේෂිත ගිනිරථ භාවිතය පිළිබඳ දැනුම<br>2. මාර්ග නීති පිළිබඳ දැනුම |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

## ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ( වෘත්තීය )

1. පරීක්ෂණය පිළිබඳ විස්තර

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| විශේෂිත ගිනිරථ භාවිතය | අදාළ වන පරිදි | 100 | 60 |

2. පවත්වනු ලබන බලධාරියා
   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
   වසරකට දෙවරක් හෝ අවශ්‍යතාවය පරිදි

4. පරීක්ෂණය සඳහා වන විෂයය නිර්දේශය

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| විශේෂිත ගිනිරථ භාවිතය | 1. විශේෂිත ගිනිරථ පරීක්ෂා කිරීම<br>2. විශේෂිත ගිනිරථ ක්‍රියාත්මක කිරීම<br>3. විශේෂිත ගිනිරථ ක්‍රියාකරවීමේ කාර්යක්ෂමතාව<br>4. මාර්ග සංඥා භාවිතයේ ප්‍රායෝගික අවස්ථා<br>5. විශේෂිත ගිනිරථ මගින් ජලය ලබාදීම<br>( එක් විෂයක් සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 20 වන අතර සමත්වීම සඳහා එක් එක් විෂයට ලකුණු 12 බැගින් ලකුණු 60 ක් ලබාගත යුතුය. ) |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදි.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ [illegible] ලේකම්

**ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ මූලික ගිනිහට තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ( ලිඛිත )**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | පැය 02 | 100 | 40 |
| විධානය හා නායකත්වය | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා

   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග

   වසරකට දෙවරක් හෝ අවශ්‍යතාවය පරිදි

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි ඉංජිනේරු විද්‍යාව හා ගිනි නිවීම් සේවා මෙහෙයුම් | 1. මූලික ගිනිහට රාජකාරි සඳහා අදාළ සෛද්ධාන්තික කරුණු<br>2. විද්‍යා හා තාක්ෂණික නියමයන් ගිනි මෙහෙයුම් වලදී මූලික ගිනිහට රාජකාරි සඳහා යොදාගැනීමේ අවස්ථා පිළිබඳ දැනුම<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල දී මූලික ගිනිහට රාජකාරි පිළිබඳ දැනුම<br>4. ගිනි නිවීම් සේවා උපකරණ පිළිබඳ දැනුම |
| විධානය හා නායකත්වය | 1. කණ්ඩායම පාලනය කිරීම<br>2. විනය පවත්වාගෙන යාම<br>3. අණදීම හා මෙහෙයවීම<br>4. උපදෙස් ලබාදීම<br>5. ගින්නකදී හෝ ජීවිත බේරා ගැනීමකදී තම කණ්ඩායම අනතුරකට පත් නොවන පරිදි මෙහෙයවීම<br>6. පාලන මැදිරිය සහ ගිනි බිම අතර සම්බන්ධතාවය |

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

**<u>ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ ස්ථානභාර නිලධාරී තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ( ලිඛිත )</u>**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් හා නිවාරණය | පැය 02 | 100 | 40 |
| මානව සම්පත් කළමනාකරණය | පැය 01 | 100 | 40 |

2. පවත්වනු ලබන බලධාරියා
   ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක්

3. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග
   වසරකට දෙවරක් හෝ අවශ්‍යතාවය පරිදි

4. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි නිවීම් සේවා මෙහෙයුම් හා නිවාරණය | 1. ගිනි මෙහෙයුම් සඳහා අදාළ සෛද්ධාන්තික කරුණු<br>2. විද්‍යා හා තාක්ෂණික කරුණු ගිනි මෙහෙයුම් සහ නිවාරණය සඳහා යොදාගැනීමේ අවස්ථා<br>3. ප්‍රායෝගික ගිනි මෙහෙයුම්වල දී ස්ථානභාර නිලධාරි රාජකාරි පිළිබඳ දැනුම<br>4. ගිනි නිවීම් සේවා ස්ථාන පාලනය<br>5. නායකත්වය හා සැලසුම් කිරීම<br>6. කාර්යසාධන කළමනාකරණය<br>7. ආයතනික අවදානම් කළමනාකරණය<br>8. තොරතුරු රැස්කිරීම, තබාගැනීම හා ඒ ඇසුරෙන් තීරණ ගැනීමේ හැකියාව<br>9. ගිනි හා මුදාගැනීම් අවස්ථා වලදී තීරණ ගැනීමේ හැකියාව<br>10. උස් ගොඩනැගිලි වල ගිනි නිවීම් ක්‍රම - ඉතා උස් හා මධ්‍යස්ථ ගොඩනැගිලි<br>11. අවදානම් තක්සේරුව හා ඊට අදාළ උපායන් තීරණය කර ක්‍රියාත්මක කිරීම<br>12. විවිධ ස්ථාන ආශ්‍රිත ගිනි නිවීම් ක්‍රම හා මුදාගැනීම |



ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.10.25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ ... ලේකම්

### අයදුම්කරුගේ ප්‍රකාශය

..............................................................................ආයතනයේ ........................................................
...........................................................( සම්පූර්ණ නම ) වන මා විසින් ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, චේතනාන්විතව කිසිවක් සඟවා නොමැති බවත් සහතික කරමි. තව ද, ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණයේ පළමු පෙළ ගිනිභට, මූලික ගිනිභට හා ස්ථානභාර නිලධාරී තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කොන්දේසිවලට හා කලින් කලට ඊට කරනු ලබන සංශෝධනවලට යටත්ව, ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනයන්හි නියාමන සේවා ගණය යටතේ වන පළමු පෙළ ගිනිභට තනතුරට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කරමි.

නිලධරයාගේ අත්සන :- ..................................................................
නම :- ...........................................................................................
දිනය :- .........................................................................................

### ආයතන ප්‍රධානියාගේ සහතිකය

1. පත්වීම් ලිපිය අනුව නිලධාරියාගේ සම්පූර්ණ නම : -..................................................................
   ........................................................................................................................................
2. මුල් පත්වීම් දිනය :- ...........................................
3. පත්වීම් ලිපියේ අංකය :-......................................
4. වැටුප් පරිමාණය :-.............................................
5. මුල් තනතුරේ පිහිටුවා ඇති වැටුප් පියවර :- ...........
6. 2019.01.01 දිනට උපයාගෙන ඇති වැටුප් වර්ධක සංඛ්‍යාව :-...................................................
7. RS - 1 වැටුප් පරිමාණයට අදාළව 2019.01.01 දිනට ගෙවනු ලැබූ වැටුප් පියවර :-........................

..........................................................................................(ආයතනය) ……….....................(තනතුර) වශයෙන් සේවය කරන...............................................................(නම) මහතා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු, එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි වන අතර, මෙම බඳවා ගැනීමේ පරිපාටියේ 14.1 සහ 14.2 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණය යටතේ පළමු පෙළ ගිනිභට තනතුරට .............................. දින සිට අන්තර්ග්‍රහණය කිරීමට සෑම අයුරින්ම සුදුසු බව සහතික කරමි / නොකරමි.

අත්සන : - .........................................................

නම : - ...............................................................

තනතුර : - .........................................................

දිනය :- ...............................................................

( නිල මුද්‍රාව)

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021|10|25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

__පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය__

ඉහත ආයතනයේ සේවය කරන ........................................................................ මහතා ඉහත බඳවා ගැනීමේ පරිපාටියේ 14.1 සහ 14.2 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණය යටතේ ............................................ තනතුරට ............................... දින සිට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි / නොකරමි.

අත්සන :- ............................................................

දිනය :- ..............................................................

( නිල මුද්‍රාව)

__පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය__

ඉහත ආයතනයේ සේවය කරන ........................................................................ මහතා ඉහත බඳවා ගැනීමේ පරිපාටියේ 14.1 සහ 14.2 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණය යටතේ ............................................ තනතුරට ............................... දින සිට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි / නොකරමි.

අත්සන :- ............................................................

දිනය :- ..............................................................

( නිල මුද්‍රාව)

__ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය__

ඉහත ආයතනයේ සේවය කරන ........................................................................ මහතා ඉහත බඳවා ගැනීමේ පරිපාටියේ 14.1 සහ 14.2 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ඌව පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි නියාමන සේවා ගණය යටතේ ............................................ තනතුරට ............................... දින සිට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි / නොකරමි.

අත්සන :- ............................................................

දිනය :- ..............................................................

( නිල මුද්‍රාව)

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021/10/25 ........................ දින
අනුමත කරන ලදී.
........................................
ඌව පළාත් ආණ්ඩුකාරවර ~~ලේකම්~~/ සහකාර ලේකම්

ජාතික වැටුප් කොමිෂන් සභාව
தேசிய சம்பள ஆணைக்குழு
NATIONAL PAY COMMISSION
කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
Room No.2-116, B.M.I.C.H, Bauddhaloka Mawatha, Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | 2669134 | ෆැක්ස් / பக்ஸ் / Fax | 2669134 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | nscc36@gmail.com |
| මගේ අංකය / எனது இல. / My No. | NSCC/12/78/2/1/SR | ඔබේ අංකය / உமது இல. / Your No. | 3/1B/6/1-51 | දිනය / திகதி / Date | 2020.06. 12 |


ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ඌව පළාත් සභාව.

<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල්වල අනධ්‍යයන ප්‍රාථමික ශිල්පීය නොවන කාර්ය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ඔබගේ සමාංක හා 2019.12.12 දිනැති ලිපිය සහ 2020.02.12 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම කොමිෂන් සභා කාර්යාලයේ දී පැවති සාකච්ඡාව හා බැඳේ.

02. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල්වල අනධ්‍යයන ප්‍රාථමික් ශිල්පීය නොවන කාර්ය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ හා උසස්වීම් ක්‍රමවේදයේ පවතින අඩුපාඩු නිවැරදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය හා සකස් කර ඇති නව බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පතට අනුව ඒ ඒ ශ්‍රේණි ක්‍රමයට මෙම සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම කළ යුතු ආකාරය පිළිබඳව මෙම කොමිෂන් සභාවේ උපදෙස්, නිරීක්ෂණ හා නිර්දේශ එම ලිපිය මඟින් විමසා ඇත.

03. ඒ අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ පහත පරිදි වේ.

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව තනතුරුවලට බඳවා ගැනීම පිළිබඳව පැහැදිලි චක්‍රලේඛ උපදෙස් නිකුත් කර ඇති අතර ඒ සඳහා සියලු බඳවා ගැනීම් සිදුකළ යුත්තේ තනතුරේ ආරම්භක ශ්‍රේණියට සහ ආරම්භක වැටුප් පියවරට ය. ඒ අනුව දැනට සිදු කර ඇති බඳවා ගැනීම් නිවැරදි නොවන බව මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරේ.

II. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින පාසල්වල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුත්තේ ආරම්භක ශ්‍රේණියට බැවින් බඳවාගත් දිනට නියමිත ශ්‍රේණියේ පිහිටුවා ඒ අනුව වර්තමානයට ගැලපෙන ශ්‍රේණිය ලබා දීමට කටයුතු කිරීමත් නියමිත තනතුරට සහ ශ්‍රේණියට අදාළ වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබා නොදී වැටුප් වර්ධකවලින් හිලව් කිරීමට කටයුතු කිරීමත් සුදුසු බව මෙම කොමිෂන් සභාව නිර්දේශ කෙරේ.

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021 | 10 | 25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සහකාර ලේකම්

III. ඔබගේ උක්ත ලිපිය සමඟ ඇමුණුම 1 මඟින් ඉදිරිපත් කර ඇති බඳවා ගැනීම් පටිපාටි කෙටුම්පත මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

චන්ද්‍රානි සේනාරත්න

චන්ද්‍රානි සේනාරත්න
ලේකම්
ජාතික වැටුප් කොමිෂන් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021|10|25 දින
අනුමත කරන ලදී.
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්/ සා[illegible]ලේකම්